**GMOA** TU No. 291
ESTABLISHED IN 1926
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

24.08.2011

පුවත්පත් නිවේදනය

## අම්පාර දිස්ත්‍රික්කය තුළ රෝගි ප්‍රතිකාර සේවා බිඳවැටීම

අම්පාර දිස්ත්‍රික්කය තුළ සේවය කරන වෛද්‍යවරු තම සේවා ස්ථාන තුළ දැඩි දුෂ්කරතා මධ්‍යයේ රෝගි සත්කාර සේවා පවත්වාගෙන යති. නාගරික ප්‍රදේශවල සේවය කරන වෙනත් නිලධාරීන්ට හිමි කිසිදු පහසුකමක් ඔවුන්ට හිමි නැත. දවසේ පැය විසි හතර පුරාම සේවය පවත්වාගෙන යාම සඳහා ඔව්හු දැඩි කැපකිරීමක් සිදුකරති. තත්ත්වය මෙසේ තිබියදී අම්පාර දිස්ත්‍රික්කය තුළ අමතර සේවා දීමනා ගෙවීම අප්‍රේල් මාසයේ සිට පළාත් සෞඛ්‍ය බලධාරීන් විසින් ඕනෑකමින්ම පැහැර හැර ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය දුෂ්කර පළාත්වල සෞඛ්‍ය සේවාව නැංවීමට උත්සාහ ගනිද්දී පළාත් සෞඛ්‍ය බලධාරීන් මෙසේ කටයුතු කිරීම කණගාටුදායක තත්වයකි.

මෙයට විරෝධය පළකිරීමක් ලෙස අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා බළ ප්‍රදේශය තුළ සේවය කරන සියලුම වෛද්‍යවරු අගෝස්තු 25 වන දින සංකේත වැඩ වර්ජනයකට අවතීර්ණ වීමට තීරණය කර ඇත.

මේ සම්බන්ධයෙන් රෝගි ජනතාවට වන සියලු අපහසුතාවල වගකීම, තම රාජකාරිය පැහැර හරින පළාත් සෞඛ්‍ය බලධාරීන් විසින් දැරිය යුතු බව අපි අවධාරණය කරමු.
ස්තූතියි.

මෙයට විශ්වාසී,

වෛද්‍ය චන්දික එපිටකඩුව,
ලේකම්.

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර | වෛද්‍ය උපුල් ගුණසේකර | - 0716841272 |
| | වෛද්‍ය සංකල්ප මාරසිංහ | - 0714486770 |